# සේනක සමරසිංහ

## චාල්ස් රජුගේ සම්මානයට පාත්‍රවේ.







ධෛර්යයෙන් යුතුව සිය ප්‍රජාවන්ට සේවය කිරීමේ දීර්ඝ ඉතිහාසයකට සේනක සමරසිංහ නැකම් කියයි. මා එතුමා හඳුනන්නේ ඔහු මහවැලි අධිකාරියේ මාණ්ඩලික නිලධාරියෙකු ලෙස සේවය කළ කාලයේ සිටය. ප්‍රජාව වෙත නිරාකුල හා අවංකව සේවය සැපයූ නිලධාරියෙකු ලෙස එකළ සිටම මම ඔහුව හඳුනාගෙන සිටියෙමි. ඇල මාර්ග කළමනාකරණය මහවැලියෙන් ගොවි සංවිධාන වෙත පවරා දීමේ දී ඇතිවූ ගැටළුවක් නිරාකරණයට අදාළ ගම්මානයට යාම මගේ පළමු මහවැලි අධිකාරි රාජකාරිය විය. එලෙස ගියේ සේනක සමරසිංහ මහතා සමඟය. එතෙක් වාරි ජලය බෙදා ගැනීම පිළිබඳව විවිධ කාරණා නිසා පාර්ශ්ව ගණනාවක් අතර වූ ගැටුමක් නිරාකරණයට ඔහු දැක්වූ උපේක්ෂාශීලී සංයමය මම එහිදී දුටුවෙමි. ඔහු මහවැලිය පිළිබඳ සියල්ල අතැඹුලක් සේ දත්තේය. එහෙත් ඔහු සතු ඒ දැනුම මනාව උපයෝගී කර ගැන්මට පරිපාලකයින් සමත් වූවාදැයි නොදනිමි. සමරසිංහ මහතාගේ මහවැලිය පිළිබඳ දැනුම ඔහු ලියන ලද 'Accelerated Mahaweli Development Program; Memoirs of a staffer' කෘතියෙන් විදහා දැක්වේ.

සේනක මීට දස වසරකට පමණ පෙර කැනඩාවේ මැනිටෝබා ප්‍රාන්තයට පැමිණියේය. එසේ පැමිණ කල්ගතවත්ම ක්‍රමයෙන් ඔහු පරණ පුරුදු දක්ෂකමින්ම ශ්‍රී ලාංකික ප්‍රජාව තුලත් අනෙකුත් ප්‍රජාවන් සමගත් සම්බන්ධතා ජාලයක් සකස්කර ගත්තේය. ශ්‍රී ලංකා මැනිටෝබා සංගමයේ (SLAM) සභාපති ලෙසත්, මැනිටෝබා වැඩිහිටි සමාජය (Sri Lankan Seniors Manitoba) 2022 පිහිටුවීමට නායකත්ව කාර්යභාරයක් කරමින් වසර දෙකක් එහි සභාපති ධුරය දරමිනුත් සමරසිංහ මහතා කළ කාර්යභාරය පැසසුමට ලක්වේ. ඔහු ඉටු කළ කාර්යභාරයන් අතර 2016 මැනිටෝබාහි ශ්‍රී ලංකා වෙළඳ ප්‍රදර්ශනය පැවැත්වීම, නිව් හොරයිසන් වැඩිහිටි වැඩසටහනේ (New Horizons Seniors Program) අරමුදල් කාර්යක්ෂමව යෙදවීම, ආදි කටයුතු ප්‍රමුඛ වේ. ඊට අමතරව මැනිටෝබා ප්‍රාන්තයේ බෞද්ධ කටයුතු නගාලීමට ඔහුගෙන් විශාල මෙහෙයක් ඉටු වෙමින් පවතී. සමරසිංහ මහතා ජාතික ආගමික කටයුතුවල නියලීමේ ජීවන පුරුද්ද ලංකාවේ සිටම ප්‍රගුණ කරන ලද්දකි.

### සම්මානයට පාත්‍ර වීම

කැනඩාවවට පැමිණ සිය ප්‍රජාවට සමරසිංහ මහතා දීර්ඝ කාලයක් තිස්සේ කළ උත්කෘෂ්ට සේවාවන් අගයමින් 3 වන චාල්ස් රජුගේ කිරීට පදක්කම පිරිනැමීමට ඔහුද තෝරාගත්තේය. එම සම්මාන ප්‍රදානෝත්සවය 2025 මාර්තු 8 වන දින විනිපෙග් හි කanad Inns Hotel, Pembina හි දී පැවැත්විණි. ඒ සඳහා චාන්දනී සමරසිංහ මහත්මිය, ශ්‍රී ලංකා මැනිටෝබා සංගමයේ සභාපති නන්දික බණ්ඩාර, ශ්‍රී ලංකා මැනිටෝබා ජ්‍යේෂ්ඨයින්ගේ සංගමයේ උප සභාපතිනි එලියන් ජෝෂප් හා සමරසිංහ පවුලේ දියණියක වන චමතිද, සමරසිංහ මහතා සමග සම්මාන ප්‍රදානයට සහභාගි විය. කැනඩා රජය වෙනුවෙන් ක්‍රීඩා හා තැනිතලා ඉඩම්හි ආර්ථික සංවර්ධන කටයුතු අරබයා වගකීම් දරණ අමාත්‍ය ටෙරී ඩුගුයිඩ් (Terry Duguid, Minister of Sport and Minister Responsible for Prairies Economic Development Canada) සම්මාන ප්‍රදානය කළේය. මෙම අමාත්‍යවරයා අතින්ම 2017 දී කැනේඩියානු ෆෙඩරේෂනයට වසර 150ක් පිරීමේ සැමරුම් උත්සවයේදීත්, 2022 වසරේ දී මියගිය II එලිසබෙත් රැජිනගේ රාජාභිෂේකයේ ෆ්ලැටිනම් සංවත්සරයේ දීත් සමරසිංහ මහතා සම්මාන ලබාගන්නා ලදී.

යාත්‍රා පුවත්පතේ දීර්ඝ කාලීන අනුග්‍රාහකයෙකු වන සේනක සමරසිංහ මහතාට අපගේ සුබ පැතුම් සමඟ දීර්ඝායු පතමු.

- චබීරා -

